Australian Government
Department of Home Affairs

# කෝවිඩ්-19 පරීක්‍ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිවුවද, ඔබ විසින් මහජන සෞඛ්‍යය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්‍ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්‍ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

### වික්ටෝරියා ප්‍රාන්තයේ සංක්‍රමණ සෞඛ්‍යය පරීක්‍ෂණ

තවදුරටත් ඇති කෝවිඩ්-19 සීමා හේතුවෙන්, වික්ටෝරියා ප්‍රාන්තයේ සියළුම සංක්‍රමණ වෛද්‍ය පරීක්‍ෂණ තාවකාලිකව නවත්වා ඇත. වැඩිදුර මහජන සෞඛ්‍යය නිවේදනයන්ට අනුකූලව මෙම තීරණය සමලෝචනය කරනු ඇත.

# මා හට බ්‍රිජිං වීසා බලපත්‍රයක් ඇත

## මා හට බ්‍රිජිං වීසා ඒ, බී හෝ සී බලපත්‍රයක් ඇත

ඔබට දැනට බ්‍රිජිං වීසා ඒ, බී, හෝ සී බලපත්‍රයක් ඇතිනම්, ඔබගේ වීසා අයදුම්පත්‍රය හෝ සමාලෝචනය සලකා බලන තෙක් ඔබට ඕස්ට්‍රේලියාවේ සිටීමට අවසර ඇත. කෙසේ වුවද, ඔබ සම්බන්ධයෙන් දැනට සංක්‍රමණ තීරණ හෝ සමාලෝචන නැතිනම්, සහ ඔබට ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාමට නොහැකිනම්, ඔබව නීත්‍යානුකූල කර තැබීම සඳහා නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

ඔබ බ්‍රිජිං වීසා ඒ හෝ සී බලපත්‍රයක් දරයි නම් සහ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යන්නේ නම්, ඔබගේ බ්‍රිජිං වීසා ඒ හෝ සී බලපත්‍රය අවසන් වනු ඇත. බ්‍රිජිං වීසා ඒ බලපත්‍රධාරීන් විසින් ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාමට පෙර බ්‍රිජිං වීසා බී බලපත්‍රයකට අයදුම් කිරීමට සලකා බැලිය හැකිය.

- බ්රිජිං වීසා බී බලපත්ර සලකා බැලීම දිගටම සිදු කෙරේ. කෙසේවුවද, ගමන් සීමා තිබියදී බැහැර කිරීමකට අයදුම් කර නැතිනම්, බ්රිජිං වීසා බී බලපත්රධාරීන් හට ඕස්ට්රේලියාවට ඇතුළුවීම ප්රතික්ෂේප කරනු ඇත. ගමන් සීමා සහ බැහැර කිරීම් සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා ඕස්ට්රේලියාවට පැමිණීම බලන්න.

## මා හට බ්රිජිං වීසා ඊ බලපත්රයක් ඇත

පහත අවස්ථාවලදී බ්‍රිජිං වීසා ඊ බලපත්‍රයක් මගින් ඔබට ඕස්ට්‍රේලියාවේ සිටීමට හැකියඃ

- පිටත්ව යාමට කටයුතු කරන අතරතුර
- සංක්‍රමණ තීරණයක් බලාපොරොත්තුවෙන් සිටින අතරතුර.

ඔබ නීතිවිරෝධීවී වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කල නොහැකිනම්, හැකි විගස බ්‍රිජිං වීසා ඊ බලපත්‍රයකට අයදුම් කිරීම මගින් ඔබට ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූල තත්වය ලබා දෙන අතර, හැකි විහස පිටත්ව යාමට කටයුතු පිළියෙල කර ගත හැකිය.

ඔබ සතුව බ්‍රිජිං වීසා ඊ බලපත්‍රයක් ඇති අතර එය අවසාන වීමට පෙර ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා නොහැකි නම්, නීත්‍යානුකූලව සිටීම සඳහා තවත් බ්‍රිජිං වීසා ඊ බලපත්‍රයකට අයදුම් කල යුතුය.

- ඔබට ImmiAccount ඔස්සේ මාර්ගගතව අයදුම් කල හැකිය
- ඔබට ImmiAccount සඳහා ප්‍රවේශය නොමැතිනම්, අයදුම්පත්‍රයක් ඊමේල් හෝ තැපැල් මගින් යැවිය හැක (Form 1008 – Application for a Bridging visa E – subclass 050).

නීතිවිරෝධී පුරවැසියන් හෝ බ්‍රිජිං වීසා ඩී හෝ ඊඟ බලපත්‍රධාරීන් වශයෙන් ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යන අය හට කාලසීමාවක් සඳහා ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් බැහැර කල හැකි අතර අනාගත වීසා අයදුම් පත්‍ර සඳහාද බලපෑම් ඇතිවිය හැකියඃ

- නැවත ඇතුළුවීමට ඇති සීමා සම්බන්ධ වැඩිදුර විස්තර නැවත ඇතුළුවීමට ඇති සීමා වෙතින් ලබාගත හැකිය.

## බ්‍රිජිං වීසා බලපත්‍රයක් දරණ අතර වැඩ කිරීම

ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍ර කොන්දේසි අනුව ඕස්ටේ්‍රලියාවේ වැඩ කල හැකිවිය හැකිය. ඔබට පහත ආකාරයට පරීක්ෂා කර ගත හැකියඃ

- VEVO සේවාව භාවිතයෙන්, හෝ
- ඔබගේ ImmiAccount ඔස්සේ වීසා කොන්දේසි සඳහා ප්‍රවේශවීම මගින්.

ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍රය මගින් වැඩ කිරීමට ඉඩ ලබා නොදේ නම්, හෝ වැඩ කිරීම සම්බන්ධ සීමා ඇතිනම්, ඔබට වැඩ කිරීමට ඉඩ ලබාදෙන වෙනත් බ්‍රිජිං වීසා

බලපත්‍රයකට අයදුම්කල හැකිවේ. මෙය සීමාසහිත අවස්ථාවල පමණක් ලබාගත හැකි අතර ඒ සඳහා ඔබට මූල්‍ය දුෂ්කරතා ඇති බවට සනාථ කල යුතුය.

ඔබට වැඩ කිරීම සඳහාවූ අවශ්‍යතා සපුරාලන්නේ නැතිනම් සහ තව දුරටත් බ්‍රිජිං වීසා බලපත්‍රයකට සුදුසුකම ඇතිනම්, ඔබගේ කලින් බ්‍රිජිං වීසා බලපත්‍රයේ තිබුණු කොන්දේසි හා සමාන කොන්දේසි සහිත නව බ්‍රිජිං වීසා බලපත්‍රයක් ප්‍රදානය කරනු ඇත.

## කාලය ඉකුත්වන බ්රිජිං වීසා බලපත්‍ර

ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට ආසන්න නම්, විශේෂයෙන් ඔබට පවුල් උපකාර නැතිනම්, ඔබට හැකිනම් හැකි විගස සිය මව්බිමට යාමට සලකා බැලිය යුතුය.

මීලඟ මාස හය ඇතුලත තමාගේ කටයුතු කරගත නොහැකි තාවකාලික වීසා බලපත්‍රධාරීන් හට සිය මව්බිමට යාම තරයේ උනන්දු කරන අතර හැකි විගස කටයුතු පිළියෙල කර ගත යුතුය.

ඔබට ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා නොහැකිනම්, ඔබ විසින් වලංගු වීසා බලපත්‍රයක් පවත්වා ගත යුතුය. ගමන් සීමා ඉවත්කල පසු ඕස්ට්‍රේලියාවෙන් පිටත්වන බවට අපේක්ෂා කෙරේ.

වැඩිදුර විස්තර සඳහා බලන්නඃ ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත් වනු ඇත හෝ කාලය ඉකුත්වී ඇත.

ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටින අතර වීසා බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමට පෙර රටට ඇතුළු විය නොහැකිනම්, ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර, ඔබ විසින් අළුත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතු අතර වීසා බලපත්‍රයක් ප්‍රදානය කර තිබිය යුතුය.

වීසා බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කල නොහැක. ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටින විට, වලංගු බ්‍රිජිං වීසා බී (BVB) බලපත්‍රයකට අයදුම්කල නොහැකි අතර, BVB වීසා බලපත්‍රයක් ප්‍රදානය කල නොහැක.

## උපකාරක සේවා

ඔබගේ වීසා තත්වය විසඳා ගත නොහැකිනම්, ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ තත්ව විසඳාලීමේ සේවාව (Status Resolution Service (SRS)) මගින් උපකාර ලබාදිය හැකිය.

වැඩිදුර විස්තර ලබාගත හැකියඃ තත්ව විසඳාලීමේ සේවාව

SRS නිලධාරීන් විසින් ඔබට ඇති වීසා බලපත්‍ර විකල්ප පහදා දෙන අතර, ඔබ විසින් දැන් ගනු ලබන තීරණ අනාගත විකල්පවලට බලපාන ආකාරය පහදා දෙනු ඇත. ඔවුන් විසින් ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාම සැලසුම්කර දිය හැකි අතර, අවශ්‍ය අවස්ථාවල වෙනත් සේවාවලට යොමු කරනු ඇත.

විශේෂිත අවස්ථාවල, දෙපාර්තමේන්තුවේ තත්ව විසඳාලීමේ සේවාව මගින් සුදුසුකම් ඇති අය සඳහා ඕස්ට්‍රේලියාවෙන් යාමට උපකාර කල හැකිය. දෙපාර්තමේන්තුවේ සිය නැවත යන අය සඳහාවූ උපකාර වැඩ සටහනේ සේවා සපයන්නන් වශයෙන්

සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානය (International Organisation for Migration (IOM)) සහ සර්කෝ (හෝම්වෝර්ඩ්) සමඟ ගිවිසුම් ඇතිකරගෙන ඇත.

නැවත යන අය සඳහාවූ උපකාර වැඩසටහන මගින් සුදුසුකම් ඇති අය හට පහත සඳහන් උපකාර එකක් හෝ සංයෝජනයක් ලබාදිය හැකියඃ

- නැවත යාම සඳහාවූ ස්වාධීන උපදේශක සේවා
- ගුවන් ප්‍රවේශ පත්‍රය
- ගමන් ලියකියවිලි ලබා ගැනීමට උපකාර
- පිටත්ව යන රටෙහි පිළිගැනීම සම්බන්ධ උපකාර
- අවසාන ගමනාන්තයට ගමන් උපකාර.

නැවත යන අය සඳහාවූ උපකාර සඳහා සුදුසුකම් ලැබීම සඳහා, පහත අවශ්‍යතා සපුරාලිය යුතුයඃ

- පුරවැසියෙකු නොවීම
- ඕස්ට්‍රේලියාවට නැවත ඇතුළුවීමට වීසා බලපත්‍රයක් නැතිවීම
- සම්භවය ඇති රටකට හෝ ඔබට ඇතුළුවීමට සහ රැඳී සිටීමට අයිතිය ඇති රටකට යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වීම
- ඔබගේ නැවත යන ගමනට මුදල් සම්පාදනය කරගත නොහැකි බව සනාථ කිරීම.

වැඩිදුර විස්තර සඳහාඃ [පිටත්ව යාමට උපකාර]

තත්ව විසඳාලීමේ උපකාරක සේවාව (Status Resolution Support Services (SRSS)) මගින් සිය සංක්‍රමණ තත්වය විසඳාලන තෙක් ඕස්ට්‍රේලියයානු ප්‍රජාව තුල තාවකාලිකව සිටින පුරවැසියන් නොවන අය හට උපකාර ලබාදේ. සිය සංක්‍රමණ තත්වය ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සමඟ විසඳා ගනු ලබන අතර තමා හට උපකාර කරගත නොහැකි අය සඳහා SRSS වැඩසටහන මගින් කෙටිකාලීන, අවශ්‍යතා අනුව උපකාර ලබාදේ. මෙය දිගින් දිගට ලබාදෙන සුබසාධක හිමිකමක් නොවේ.

වැඩ කිරීමේ අයිතිය ඇතිව බ්‍රිජිං වීසා බලපත්‍රවල සිටින, වැඩ කල හැකි අය විසින් සිය සංක්‍රමණ තත්වය විසඳාලන අතර තමාගේ කටයුතු කරගත යුතුය.

කෝවිඩ්-19 කාලපරිච්ඡේදයේදී, SRSS යටතේ උපකාර සඳහාවූ අයදුම්පත්‍ර එක් එක් අයදුම්පත්‍රයේ පදනම අනුව සලකා බලනු ඇත.

වැඩිදුර විස්තර ලබාගත හැකියඃ [තත්ව විසඳාලීමේ උපකාර සේවා]